Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**08 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **1- 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

---

01. ශ්‍රී ලංකාව සෞඛ්‍ය සේවාවේ විශාල දියුණුවක් ලබා සිටියද හෘදරෝග, දියවැඩියාව, වකුගඩුරෝග හා ............................................. වැනි බෝනොවන රෝග වර්තමානයේ වර්ධනය වෙමින් පවතී.
(පිළිකා / ඩෙංගු / පාචනය)

02. වැඩි දෙනෙක් අතර ............................................................................................ ප්‍රචලිත ගෘහස්ත ක්‍රීඩාවක් වේ.
(පිහිණීම / ඇවිදීම / පංචදැමීම)

03. අයහපත් චිත්තවේග සමනයකිරීම සඳහා ..................................................... ගතයුතු හොඳම ක්‍රියාමාර්ගය වේ.
(භාවනා කිරීම / තරඟවලට සහභාගිවීම / විදේශගත වීම)

04. ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු ගුණාංගයක් ලෙස ................................................. සමාජයතුළ පිළිගෙන ඇත.
(සමාජශීලීබව / ආක්‍රමණශීලීබව / අනම්‍යශීලීබව)

05. බහුසංස්කෘතික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සිංහල දෙමළ ................................................. යන ප්‍රධාන ජනවර්ග තුන ජීවත්වේ.
(බර්ගර් / මැලේ / මුස්ලිම්)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06. සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය සංස්කෘතියයි. (..........)
07. ඇමරිකා එක්සත් ජනපදයේ සුදුජාතීන් සමඟ වෙනත් ජනවර්ග ජීවත්වන බව හඳුනාගෙන ඇත. (..........)
08. වගුරුබිම් ගොඩකිරීම ගංවතුර තර්ජනයට පිළියමකි. (..........)
09. නියඟය පරිසරයට පමණක් බලපෑම් ඇතිකරයි. (..........)
10. උස් පහත් භේදයකින් තොරව ජපන් රටේ වැසියෝ පාපැදිය බහුලව භාවිතකරයි. (..........)

- **අංක 11 - 15 දක්වා A හා B තීරු දෙකේ සම්බන්ධතාවය තේරුම්ගෙන යාකරන්න.**

| | A තීරුව | B තීරුව |
|---|---|---|
| 11. | පිළිමතලාව | ධීවර කර්මාන්තය |
| 12. | අම්බලංගොඩ | වී ගොවිතැන |
| 13. | මොළගොඩ | පිත්තල බඩු කර්මාන්තය |
| 14. | ගාල්ල - මාතර | වෙස් මුහුණු / රූකඩ නිපදවීම |
| 15. | අනුරාධපුර / අම්පාර | මැටි ආශ්‍රිත නිෂ්පාදන |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න හොඳින් කියවා දී ඇති වරණ හතරෙන් වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

16. තමන් කරන රැකියාව ගැන තමන්ට අභිමානයක් ඇතිකරගැනීම.

(1) ශ්‍රමාභිමානය නම්වේ. (2) ආත්මාභිමානය නම්වේ.

(3) ආත්මතෘප්තිය නම්වේ. (4) ආත්ම ගෞරවය නම්වේ.

17. වැඩලෝකයතුළ ගොවි, කම්කරු වැනි රැකියා වැය කරන ශ්‍රමයේ ප්‍රමාණය අනුව වර්ගකර ඇත්තේ,

(1) කායික ශ්‍රමය ලෙසයි. (2) මානසික ශ්‍රමය ලෙසයි.

(3) කායික හා මානසික ශ්‍රමය ලෙසයි. (4) ශ්‍රමාභිමානය ලෙසයි.

18. ඖෂධ භාවිතයේදී වඩාත් වැදගත් වන්නේ මින් කුමක් ද?

(1) නියමිත මාත්‍රාව ගැනීම. (2) ඕනෑම ෆාමසියකින් ලබාගැනීම.

(3) නිෂ්පාදිත රට සොයා බැලීම. (4) දීර්ඝ කාලයක් අඛණ්ඩව පාවිච්චි කිරීම.

19. ශ්‍රී ලංකාව මැලේරියාව දුරුකළ රටක් බවට මෑතකදී ප්‍රකාශයට පත්කර ඇත්තේ,

(1) ලෝක සෞඛ්‍ය සංවිධානය මඟිනි. (2) මැලේරියා මර්ධන ව්‍යාපාරය මඟිනි.

(3) රතුකුරුස සංවිධානය මඟිනි. (4) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟිනි.

20. අධ්‍යාපනය ලැබීම ළමා අයිතිවාසිකමක් වන අතර ඒ හා බැඳුණු යුතුකම වන්නේ,

(1) පාසල් නොගොස් අන්තර් ජාලය මඟින් විශාල දැනුමක් ලැබීමයි.

(2) ගුරුවරයාගේ බලකිරීමට ඉගෙනීමයි.

(3) ගුරුසිතනොරිදවා හොඳින් අධ්‍යාපනය ලැබීමයි.

(4) අධ්‍යාපනය මිස විනය නීති නොසලකා හැරීමයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. (i) A රූපයේ දක්වෙන මුහුනෙන් පෙන්නුම් කරන චිත්තවේගය නම් කරන්න. (ල.02)

.......................................................................................................

(ii) එම චිත්තවේගය හේතුකොටගෙන ශරීරයේ සිදුවන ප්‍රතික්‍රියා දෙකක් සඳහන් කරන්න. (ල.02)

.......................................................................................................

(iii) B රූපයෙන් පෙන්නුම්කරන මුහුණ කුමන චිත්තවේගී තත්වයක් දැයි සඳහන් කරන්න. (ල.02)

.......................................................................................................


(iv) මෙවැනි චිත්තවේගී තත්වයක් ඇතිවූවිට ශරීරයේ සිදුවන ප්‍රතික්‍රියා දෙකක් සඳහන් කරන්න. (ල.02)

.......................................................................................................

A



B



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(v) C රූපයේ සඳහන් පරිදි ක්‍රීඩකයින් දෙදෙනා නිරත වී සිටින ක්‍රීඩාව නම් කරන්න. (ල.02)

......................................................................................................



C

(vi) මෙම ක්‍රීඩාවෙහි නිතරවන අවස්ථාවේ සිදුවිය හැකි හදිසි අනතුරු දෙකක් සඳහන් කරන්න. (ල.02)

......................................................................................................

(vii) D රූපයේ දක්වෙන්නේ දරුණු ගංවතුර අවස්ථාවකි. එවැනි අවස්ථාවන් උදාවීමට බලපාන ස්වාභාවික හේතු දෙකක් සඳහන් කරන්න. (ල.02)

......................................................................................................



D


(viii) මෙවැනි ආපදාතත්වයක් ඇතිවූ අවස්ථාවක හානි අවමකරගැනීමට ගන්නා ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල.02)

......................................................................................................

02.



A



B



C

(i) ඉහත A, B, C පින්තූරවලින් දක්වෙන සේවාවන් හඳුනාගෙන නම් කරන්න. (ල.03)

A. ......................................................................................................

B. ......................................................................................................

C. ......................................................................................................

(පිරිසිදු පානීය ජලය සැපයීම / අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීම / අඛණ්ඩව සේවා සැපයීම / නියමිත වේලාවට බිල්පත් ගෙවීම / ජල සැපුයමට අදාළ උපකරණ ආරක්ෂා කිරීම / ජලය අපතේ යෑම වැළැක්වීම / අනිසි ලෙස භාවිත කිරීමෙන් වැළකීම / නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කිරීම)

(ii) ඉහත වරහන තුළ ඇතුළත් කරුණු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.08)

| ජල සම්පාදන ආයතනවලින් ඉටුවන යුතුකම් | ප්‍රයෝජනයට ගන්නා ජනතාවගේ යුතුකම් |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |
| 3. ........................................ | 3. ........................................ |
| 4. ........................................ | 4. ........................................ |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පහත සඳහන් නායකයින් පිළිවෙලින් පවුල, පාසල හා සමාජය වෙනුවෙන් ඉටුකරන ලද කාර්යයන් දෙකක් හා එම කාර්යයන් වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් එක බැගින් සඳහන් කරන්න.

| නායකයා | පවුල, පාසල හා සමාජය වෙනුවෙන් ඉටුකරන කාර්යයන් | එම කාර්යයන් වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් | |
|---|---|---|---|
| පියා | 1. ................................<br>2. ................................ | 1. ................................ | (ල.03) |
| විදුහල්පති | 1. ................................<br>2. ................................ | 1. ................................ | (ල.03) |
| ශිෂ්‍යනායක | 1. ................................<br>2. ................................ | 1. ................................ | (ල.03) |
| මහජන නියෝජිත | 1. ................................ | 1. ................................ | (ල.02) |

04. (i) බහු සංස්කෘතික ලක්ෂණ වැඩිවශයෙන් දක්නට ලැබෙන රටවල් 03 ක් නම් කරන්න. (ල.03)

1. ................................ 2. ................................

3. ................................

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ආගම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.06)

| ආගම | ආගමික ග්‍රන්ථය | ආගමික උත්සව |
|---|---|---|
| 1. ................................ | ධම්ම පදය | ................................ |
| 2. ඉස්ලාම් | ................................ | ................................ |
| 3. ................................ | ................................ | නත්තල් උත්සව |

(iii) බහු සංස්කෘතික සමාජයක ගැටුම් අවම වන සේ ජීවත්වීමට පුද්ගලයා තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 02 ක් ලියන්න. (ල.02)

1. ................................................................

2. ................................................................

05. (i) වැඩ ලෝකයේ විවිධ රැකියා බෙදා දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර තුන සඳහන් කරන්න. (ල.03)

1. ................................................................

2. ................................................................

3. ................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



(ii) කිසියම් රැකියාවක් කිරීමට පෙර වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන තුනක් සහ පුහුණුව ලබාගන්නා පාඨමාලා 03 ක් සඳහන් කරන්න. (ල.06)

1. ........................................................................................................................

2. ........................................................................................................................

3. ........................................................................................................................

(iii) ආයතනයක දියුණුව සඳහා යහපත් ශ්‍රමිකයකු තුළ තිබිය යුතු ගුණාංග 02 ක් සඳහන් කරන්න. (ල.02)

1. ........................................................................................................................

2. ........................................................................................................................

06.



A B C D

(i) ඉහත A, B, C, D පින්තූර ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.04)

| පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලිය | කාලගුණික හා දේශගුණික විපර්යාස |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |

(ii) ඉහත D පින්තූරයේ දැක්වෙන අනතුරු අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් නම් කරන්න. (ල.03)

1. ........................................................................................................................

2. ........................................................................................................................

3. ........................................................................................................................

(iii) (a) මාර්ග අනතුරු සිදුවීමට මූලික හේතුවක් වන රියදුරන් අතින් සිදුවන වැරදි 02 ක් ලියන්න. (ල.02)

1. ........................................................................................................................

2. ........................................................................................................................

(b) මාර්ග අනතුරුවලට මාර්ගවල තත්වය බලපාන ආකාර 02 ක් නම් කරන්න. (ල.02)

1. ........................................................................................................................

2. ........................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


07. දී ඇති උපකාරක පද උපයෝගී කරගෙන පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. (ල.11)

<u>පහළට -</u>

1. මෙය වර්ධනය වීම ගැටලු විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජනයකි.
2. පොදු සේවාවකි.
5. බැණ වැදීම, පහර දීම, දත් මිටි කෑම වැනි ලක්ෂණ ඇතිවීම, මෙම චිත්තවේගී ආත්මය තුළ දක්නට ලැබේ.
6. පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි.
11. කජු වෙළඳාම බහුලව දක්නට ලැබෙන ගම් ප්‍රදේශයකි.

<u>හරහට -</u>

3. පුද්ගලයින්ට එදිනෙදා කටයුතුවලදී නිතර මේවාට මුහුණදීමට සිදුවේ.
4. පාසලේ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකමකි.
7. ''එකා සැමටත් - සැම එකාටත්'' යන ආදර්ශ පාඨය මෙම ව්‍යාපාරයේ දක්නට ලැබේ.
8. මෙම ක්‍රියාකාරකම තුළින් අයහපත් චිත්තවේග සමනය කරගත හැකිය.
9. ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු තුළ තිබිය යුතු ගුණාංගයකි.
10. වැඩිවශයෙන් කායික ශ්‍රමය යොදවන රැකියාවකි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**08 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | පිළිකා | 02. | පංච දූමීම | 03. | භාවනා කිරීම | 04. | සමාජශීලීබව | 05. | මුස්ලිම් |
| 06. | ✓ | 07. | ✓ | 08. | × | 09. | × | 10. | ✓ |
| 11. | පිත්තල බඩු කර්මාන්තය | 12. | වෙස් මුහුණු රූකඩ නිපදවීම | 13. | මැටි ආශ්‍රිත නිෂ්පාදන | 14. | ධීවර කර්මාන්තය | | |
| 15. | වී ගොවිතැන | 16. | 1 | 17. | 1 | 18. | 1 | 19. | 1 |
| 20. | 3 | | | | | | | | |

$(2 \times 20 = 40)$

## II කොටස

01. (i) A - තරහ (ii) පහර දීම / බැන වැදීම / දෙතොල් අත පය වෙව්ලීම

(iii) B - බය (iv) ශරීරය වෙව්ලීම / කෑගැස්ම / ඇස් විශාල වීම

(v) C - පාපන්දු ක්‍රීඩාව (vi) පාදයේ ආබාධ / වැටීම් / සීරීම්

(vii) D - අධික වර්ෂාව / වඩදිය තත්වය

(viii) ප්‍රදේශවලින් ඉවත්වීම / ආරක්ෂිත ස්ථාන කරා යාම / ජල ගැලීමට ලක්වූ ප්‍රදේශවල වාහනවලින් හා පයින් ගමන් නොයාම.

02. (i) A - වෛද්‍ය සේවය B - සන්නිවේදනය (පණිවිඩ හුවමාරුව) C - ප්‍රවාහනය

(ii)
- ආයතනය මගින් ඉටුවන යුතුකම් :- පිරිසිදු පානීය ජලය සැපයීම / සේවා අඛණ්ඩය සැපයීම / ජලය අපතේ යාම වැළැක්වීම / නඩත්තු කටයුතු නිසි පරිදි සිදුකිරීම
- මහජනයාගෙන් ඉටුවන යුතුකම් :- අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීම / නියමිත වේලාවට බිල්පත් ගෙවීම / ජල සැපයීමට අදාල උපකරණ ආරක්ෂා කිරීම / අනිසිලෙස භාවිත කිරීමෙන් වැළකීම.

03. අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.

04. (i) ඇමෙරිකා එක්සත් ජනපදය / ඉන්දියාව / ලංකාව (බහු සංස්කෘතික ලක්ෂණ දක්නට ලැබෙන රටවලට ලකුණු දෙන්න.)

(ii) 1. බෞද්ධාගම - වෙසක් පොසොන් ආදී නිවැරදි පිළිතුර වලට ලකුණු දෙන්න.

2. අල්කුරාණය / ශුද්ධ වූ කුරාණය - රාමසාන් / හජ්ජි / නබි තුමාගේ උපන්දිනය

3. කතෝලික / බයිබලය

(iii) අන්මතවලට සවන්දීම / අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ජනවර්ග, ආගම් උසස් හෝ පහත් කොට නොසැලකීම යනාදී

05. (i) 1. රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය 2. පෞද්ගලික අංශය 3. ස්වයං රැකියා

(ii) ආයතන :- වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව

පාඨමාලා :- විදුලි කාර්මික ශිල්පී, ජලනල ශිල්පී, වඩුකාර්මික ශිල්පී (අදාල පාඨමාලාවලට ලකුණු දෙන්න.)

(iii) සාධාරණ බව / අවංක බව / ක්‍රියාශීලීත්වය / ඉවසිලිමත්බව / සංවේදී බව (139 පිට)

06. (i) භෞතික ක්‍රියාවලිය - සුනාමි, භූචලන (A, B)

කාලගුණික දේශගුණික විපර්යාස - සුළි සුළං, අකුණු කුණාටු (C, D)

(ii) එළිමහන් ස්ථානවල රැඳී සිටීමෙන් වැළකීම, හුදෙකලා ස්ථානවල හෝ උසගස්යට නොසිටීම, දුරකතන භාවිතයෙන් වැළකීම, ලෝහ භාණ්ඩ ස්පර්ශ කිරීමෙන් වැළකීම යනාදී (99 පිටුව)

(iii) (a) විධිමත් පුහුණුවක් නොමැතිකම, විනය ගරුක නොවීම, බීමත්ව රිය පැදවීම, අධික වේගයෙන් රිය පැදවීම, ජංගම දුරකතන භාවිතය ආදී....

(b) මාර්ග කඩතොලු වීම, තෙල් විසිරී පැවතීම, දියසීරාව සහිත වංගු තිබීම

07. <u>පහළට</u>

1. සහයෝගය 2. අධ්‍යාපනය 5. කෝපය 6. සමානාත්මතාව 11.කජුගම

<u>හරහට</u>

3. අභියෝග 4. නර්තනය 7. සමූපකාරය 8. පිහිනීම 9. සවන්දීම

10. කම්කරු